චක්‍රලේඛ අංකය -10/2024-(i)

මගේ අංකය -සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප.)
ආදිපාද වීදිය,
කොළඹ .01
2025.06. 02

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති වල සභාපතිවරුන් වෙත.

සමුපකාර සමිතිවල කාරක සභා/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සම්බන්ධවයි.

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ අංක 10/2024 හා 2024.12.23 දිනැති චක්‍රලේඛ මගින් සමිතිවල ප්‍රධාන භූමිකා දෙකක් නිරූපනය කරන අධ්‍යක්ෂක මණ්ඩලය/ කාරක සභාව හා කාර්ය මණ්ඩල අතර ක්‍රියාකාරිත්වය තුල මතු වී ඇති ගැටළුකාරි තත්ත්වය අවම කිරිම මූලික කරගෙන ඉහත සදහන් චක්‍රලේඛය නිකුත් කර ඇත.

02.) මෙ සම්බන්ධයෙන් විවිධ පාර්ශව වලින් මා වෙත පැමිණිලි හා ඉල්ලීම් ඉදිරිපත්ව ඇත. ඒ මගින් සමිතියේ සමස්ථ කාර්ය මණ්ඩලය මෙම චක්‍රලේඛනයට ඇතුලත් කර ඇති බවත් භූමිකා ගැටුම නිර්මාණය විමේදි අධ්‍යක්ෂ මණ්ඩලයට/කාරක සභාවට සමීපව කටයුතු කිරීම සදහා නෛතික ප්‍රතිපාදන සැලසී ඇති කාර්ය මණ්ඩලයට මෙම විධිවිධාන සීමා කරන ලෙස ඉල්ලා ඇත. එසේ නොවන අවස්ථාවල සමීප ඥාතින්ද මෙකී චක්‍රලේඛයට ඇතුලත් වන බැවින් ඇතැම් සමිතිවල ධූර භාර ගැනිම සදහා සුදුසුකම් සහිත සාමාජිකයින් සොයා ගැනීම ගැටළු සහගත විය හැකි බව දන්වා ඇත.

03.) මෙම සම්බන්ධයෙන් මා විසින් අධ්‍යනය කිරිමෙන් අනතුරුව ඉහත සදහන් චක්‍රලේඛය පහත සදහන් පරිදි සංශෝධනය කරමි.

04.) ඒ අනුව ඉහත සදහන් චක්‍රලේඛයේ 07 වගන්තිය යටතේ ගැනෙන " කාර්ය මණ්ඩල" යන්න සම්බන්ධයෙන් පමණක් පහත අර්ථකථනය අදාල වන අතර අනෙකුත් වගන්තිවල සදහන් කාර්ය මණ්ඩල යන්නට සමිතියේ සමස්ත කාර්ය මණ්ඩලයම අදාල වේ.

05.) ඒ අනුව එම චක්‍රලේඛයේ 07 වගන්තියේ සදහන් කාර්ය මණ්ඩලය යනු සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබද සමුපකාර සමිති වල කළමණාකරුවන් සහ සහය කළමණාකරුවන් ඇතුලත් වන අතර අනෙකුත් සියළුම සමිති සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 3/2023 හා 2023.04.07 දිනැති චක්‍ර ලේඛය හා අංක 03/2023(1) හා 2023.05.29 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව විධායක මණ්ඩලයේ නිලධාරින් ලෙස ගැනෙන නිලධාරින් පමණක් සැලකිය යුතුය.

එම්.ඒ.පි. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත